# නැගෙනහිර පළාත්සභා මැතිවරණය

බටහිරයන්ගේ බලපෑම්, ඊනියා ජාත්‍යන්තර විශිෂ්ට පුද්ගලයන්ගේ කමිටු මානව අයිතිවාසිකම්, ඊනියා ජාත්‍යන්තර අධිකරණ හමුවේ රජයට හා රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව නඩු පවරන බවට කරන තර්ජන, කතෝලික පල්ලියේ ඇතැම් නායක පූජකවරුන්, රනිල් - හකීම් දූසංයෝගය (සුසංයෝගය නො වේ) ආදී සකලවිධ වජාතික බලවේග හමුවේ දෙමළ ජාතිවාදයට හා කොටි ත්‍රස්තවාදයට එරෙහිව අද ඇති ප්‍රධාන ක්‍රියාමාර්ග වනුයේ උතුරේ සිදුකෙරෙන මානුෂික හමුදා මෙහෙයුම් හා නැගෙනහිර පළාතේ මැයි මස 10වැනි දා පැවැත්තෙන පළාත්සභා මැතිවරණය වෙයි.

මේ පළාත්සභා මැතිවරණය පවත්වන ලෙස සර්වපාක්ෂික නියෝජිත කමිටුව විසින් ජනාධිපතිතුමාට ඉදිරිපත්කරන ලද වාර්තාවක් මගින් ඉල්ලා සිරින ලදී. මම එහි සාමාජිකයෙක් නො වෙමි. ඒ කමිටුවෙහි පුද්ගල සාමාජිකයන් නැත. එහි සාමාජිකයන් වනුයේ දේශපාලන පක්ෂ ය. මා විසින් නියෝජනය කෙරෙන දේශපාලන පක්ෂයක් ඇත. ඒ පක්ෂය දැන් මාස කිහිපයක සිට කමිටු රැස්වීම්වලට සහභාගි නොවෙයි. උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීමට ඒ කමිටවෙන් තීරණය කෙරී ඇතැයි පැවසෙයි. මේ තීරණය ගත්දින වනවිටත් ජාතික හෙළ උරුමය හා මහජන එක්සත් පෙරමුණ කමිටු රැස්වීම්වලට  සහභාගිවීම අත්හිටුවා තිබුණි. ඒ තීරණයට ම එ පෙ එකහෙළාම විරුද්ධ බවත් ඒ තීරණ අඩංගු වාර්තාවකට අත්සන් නොතබන බවත් මේ තීරුවෙන් ම දන්වා ඇත. එපමණක් නොව 13වැනි ව්‍යවස්ථාව ක්‍රියාත්මකකිරීමේ දී පොලිස් බලතල හා ඉඩම් අයිතීන් පළාත්සභාවලට අත්පත්කර දීමට තමන් විරුද්ධවන බව ම එ පෙ විසින් ජනාධිපතිතමාට ප්‍රකාශකෙරුණේ සර්වපාක්ෂික කමිටුවේ අතුරු වාර්තාව එතුමාට භාරදුන් දිනට පෙර දින ය. හැරත් වාර්තාවේ ඇත්තේ අදාළ වගන්ති ක්‍රියාත්මක කරන ලෙස මිස දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය මුළුමනින් ම ක්‍රියාත්මක කරන ලෙස නො වෙයි. කෙසේ වුවත් කිනම් ප්‍රශ්න තිබිය දී හෝ සර්ව පාක්ෂික නියෝජිත කමිටුව පවත්වාගෙන යෑම දේශපාලන වශයෙන් වැදගත් වෙයි.

බටහිරයන්ගේ ක්‍රියාකලාපය කුමන්ත්‍රණයක් නො වෙයි. ඔවුන් පහළොස්වැනි සියවසේ අගභාගයේ සිටම ක්‍රියාකරන්නේ ඔවුන්ගේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලෝ පුරා පැතිරවීමටත්, මුළු ලෝකයම තම ආර්ථික හා දේශපාලන ආධිපත්‍යය යටතට ගැනීමටත් ය. ලන්දේසීහු හා බ්‍රිතානිහු ලංකාවේ දී ඒ සම්බන්ධයෙන් දෙමළ ජාතිවාදය ජනිතකර එය උපයෝගී කරගත්හ. අද ද බ්‍රිතානිය හා ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් ඒ ප්‍රතිපත්තිය මත පදනම් වී ක්‍රියාකරනු දක්නට හැකි ය. අද ලෝක ආධිපත්‍යය ඇත්තේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට හා යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට මිස කතෝලික චින්තනයට හා කතෝලික සංස්කෘතියට නො වේ. අද කතෝලික චින්තනයට මුස්ලිම් හා වෙනත් චින්තනවලින් හා අදාළ සංස්කෘතීන්ගෙන් එල්ලවන අභියෝග හමුවේ අකමැත්තෙන් වුව ද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට යටවීමට සිදු වී ඇත. ලංකාවේ ද තත්වය එසේම ය. සාමාන්‍ය සිංහල කතෝලිකයන්ට සිංහල බෞද්ධ සංස්කෘතිය ප්‍රශ්නයක් නොවන්නේ ආගම කුමක් වුවත් සංස්කෘතික ව සිංහල කතෝලිකයන් සිංහල සංස්කෘතියට අයත් බැවිනි. එහෙත් ඇතැම් නායක කතෝලික පූජකවරුන්ට එසේ නො වෙයි. සිංහල බෞද්ධ සංස්කෘතිය වැනසීමට ඔවුන්ගේ පූර්වගාමීන්ට අවුරුදු පන්සියයකට පෙර තිබූ වුවමනාව ඔවුන්ට අදත් එලෙස ම පවතියි.

මඩු පල්ලිය සම්බන්ධ සිදාධියේ දී මේ ඉතා මැනවින් ප්‍රකාශවිණි. මඩු පල්ලිය ප්‍රදේශයේ කොටි නැතැයි මන්නාරම පදවියේ රායප්පු ජෝසප් බිෂොප්වරයා ඇතුළු නායක පූජකවරු කිහිප දෙනෙක් ම එකල ප්‍රකාශ කළහ. අපේ හමුදා මඩු පල්ලිය ආසන්නයට පැමිණි විට සිංහල කතෝලිකයන් අනාථ කරමින් කතෝලික සභාවේ තීරණයට අනුව (අඩුම තරමින් අනුමැතියට යටත් ව) මඩු මාතා ප්‍රතිමාව මඩු පල්ලියෙන් ඉවත්කර කොටි ඉන්නා ප්‍රදේශයක පල්ලියකට ගෙනගියහ. මඩු මාතා ප්‍රතිමාව අද රායප්පු ජෝසප් බිෂොප්වරයා යොදාගන්නේ කොටින්ගේ දෙමළ ජාතිවාදී දේශපාලනය සඳහා ය. කොටි මඩු මාතා ප්‍රතිමාවට මුවා වී මඩු පල්ලි භූමියෙහි බංකර තනා ඇති බව දැන් හෙළි වෙයි. රායප්පු ජෝසප් බිෂොප්වරයා ඒ බංකර පිළිබඳ නොදැන සිටියේ ද? අද හමුදාව මඩු පල්ලි භූමියට ඇතුල්වීමෙන් පසුව නිර්ලජ්ජිත ව මඩු පල්ලිය අවට ප්‍රදේශය ඊනියා යුද්ධයෙන් තොර කලාපයක් බවට පත්කරන්න යැයි ඉල්ලා සිටින බිෂොප්වරු එදා මඩු පල්ලි භූමිය කොටින්ගේ යුද කලාපයක් බවය පත්කරගැනීමට ඉඩ දුන්හ.

හමුදාව හා ආණ්ඩුව සමග කතාකර මඩු මාතා ප්‍රතිමාව මඩු පල්ලියෙන් දකුණට ගෙන ඒමට අවස්ථාව තිබිය දී බිෂොප්වරු ඒ කොටි ඉන්නා ප්‍රදේශයකට ම නැවතත් ගෙන ගියහ. හමුදාව පල්ලිවලට පහර නොදෙන බව දන්නා

© Prof. Nalin De Silva

බිෂොප්වරු ඒ උපයෝගි කරගෙන කොටි ත්‍රස්තවාදීන්ට පල්ලි අවට කඳවුරු බැඳීමට අවසර දෙති. අද කොටින්ට වඩාත්ම ආරක්ෂාව ඇත්තේ සාමාන්‍ය බංකරවලටත් වඩා පල්ලිවල යැයි සිතීමට ඉඩ ඇත. ප්‍රභාකරන් පල්ලි භූමියක තනා ඇති බංකරයක සැඟ වී ඇත්නම් අප ඉන් පුදුමයට පත්විය යුතු නො වෙයි. මඩු මාතා ප්‍රතිමාව සිංහල කතෝලිකයන්ට වැඳ පුදාගත හැකි පදේශයකට ගෙන ඒමට බිෂොප්වරු ක්‍රියාත්මක නෙවන්නේ නම් ආණ්ඩුව මැදිහත් වී හෝ එලෙස ප්‍රතිමාව ගෙන ඒමට කටයුතු කළ යුතු ය.

මානව හිමිකම් කොමිසමේ කටයුතු නිරීක්ෂණයකිරීමට පැමිණි ඊනියා ජාත්‍යන්තර ස්වාධීන විශිෂ්ට පුද්ගලයන්ගේ කණ්ඩායම ඒ සම්බන්ධයෙන් රජයට දේශපාලන වුවමනාවක් නැති බවට බවට ප්‍රකාශයක්කර නිරීක්ෂණ හටයුතවලින් ඉවත් විය. ඉන්පසු එහි සභාපති වූ භග්වතී මහතා ඒ ප්‍රකාශයෙහි ඇති සංකාව. සැකය යන වචනය අවධාරණය කරමින් ප්‍රකාශයෙන් කියන්නේ රජයට  දේශපාලන වුවමනාවක් නැති බව නොව ඒ පිළිබඳ සංකාවක් ඇති බව පමණක් යැයි ජනාධිපතිතුමාට දැනුම් දුන්නේ ය. එයට ප්‍රතිචාර දක්වමින් කණ්ඩායනෙි සාමාජිකයකු වූ නයිජල් රොඩ්ලි මහතා බීබීසියේ අගුවේ සිට බීබීසී ලොක්කන් ඉවත ලන කටු ලෙවකන සංදේශය ඔස්සේ භග්වතී මහතාගේ ප්‍රකාශය අභියෝගයට ලක්කර ඇත. ලෝක ධනවාදයේ ප්‍රචාරකයකු වූ ද කතෝලික බලපෑමක් ඇත්තාවූ ද බීබීසිය සංදේශය සඳහා කසිකබල් මාක්ස්වාදීන් කිහිප දෙනකු පත්කර ඇත්තේ ධනවාදය හා කතෝලික චින්තනයෙහි බිහි වූ කසිකබල් මාක්ස්වාදය ඒ ඒ රටවල ජාතිකත්වයට එරෙහිව අත්වැල් බැඳහන්නා බව නැවතත් මතක් කරමිනි.

අද ලෝකයේ සිටින මිලේච්ඡතම ත්‍රස්තවාදී සංවිධානය වූ කොටි සංවිධානයට එරෙහිව කරන මෙහෙයුම්වල දී කිහිප දෙනකුගේ ඊනියා මානව අයිතිවාසිකම් නැතිවන්නේ නම් එය පුදුමයට කරුණක් හෝ ලෝ පුරා හඬනගා කිවයුතු කරුණක් හෝ නො වෙයි. ආණ්ඩුව ඒ අවයමයක් කිරීමට උත්සාහ දැරිය යුතු ය. බටහිරයන් ඊනියා මානව අයිතිවාසිකම් කඩවීම් ගැන කතාකරන්නේ තමන් විරුද්ධ රටවල දී පමණක් බව පැහැදිලි ය. තමන් හා තම මිත්‍ර රටවල් කඩකරන මානව අයිතිවාසිකම් ගැන ඔවුහු නිහඬ වෙති. අද ඉරාකයේ ඇෆ්ගනිස්ථානයේ සිදුවන මානව අයිතිවාසිකම් ගැන ඇමරිකාවට කිසිම ප්‍රශ්නයක් නැත. එදා වියට්නාමයේ මානව අයිතිවාසිකම් කඩවීම් ගැන බටහිරයෝ කතා නො කළහ. ඇමරිකාව හිරොෂිමා නාගසාකි නගරවලට පරමාණු බෝම්බ හෙළුවේ ජපානය පරාද වී තිබිය දී හුදෙක් පරමාණු බෝම්බ අත්හදා බැලීම සඳහා ය. ඒ සම්බන්ධයෙන් අයිසන්හවර් නඩයට මරණයෙන් පසුව හෝ නඩු පවරා ඔවුන්ගේ ඊනියා වීරත්වය හෙළිදරවු කළ යුතු ය. එහෙත් බටහිරයෝ ඒ කිසිවක් නො කරති. ඔවුන් ඊනියා මානව අයිතිවාසිකම් කඩවීම් යොදාගන්නේ  තමන් ආශිර්වාදකරන කණ්ඩායම් පරාජය වන විට ඔවුන් ආරක්ෂා කරගැනීම සඳහා තම හමුදා එවීමට පසුබිම සකස්කිරීමට පමණ ය. බටහිරයන්ට ඇති මානව දයාවක් ගැන විශ්වාස කරන්නෝ වෙත් නම් ඒ නන්නත්තාර වී ඇති කසිකබල් මාක්ස්වාදීහු වෙති.

නැගෙනහිර පළාත්සභා මැතිවරණය පැවැත්වෙන්නේ බටහිර බලවේගවල ආණ්ඩු විරෝධී ක්‍රියා මාර්ග මධ්‍යයෙහි ය. එහි දී බටහිර හා වෙනත් විජාතික බලවේගවල නියෝජිතයා ලෙස සහභාගිවන්නේ රනිල් හකීම් බුෂ් හවුල ය. අද ඇමරිකාව ප්‍රමුඛ බටහිර බලවේග වඩාත්ම විරුද්ධ මුස්ලිම් හා බෞද්ධ සංස්කෘතීන් පදනම් කරගත් ජාතිකත්වවලට ය. රනිල් හා හකීම් බටහිර වලවේගවලට සේවයකිරීමෙන් පිළිවෙළින් සිංහලයන්ට ද මුස්ලිමුන්ට ද විරුද්ධව කොටින්ට පක්ෂව ක්‍රියා කරති. අද වන විට කොටි පිටුපස හින්දු බලවේගයක් නැත. ඔවුන් නඩත්තකෙරෙන්නේ බටහිර ක්‍රිස්තියානි හා කතෝලික බලවේග විසිනි. අද අවශ්‍ය වන්නේ බටහිරයන්ට විරුද්ධව බෞද්ධ හින්දු මුස්ලිම් එකතුවකි. ඉරාන ජනාධිපති ලංකාවට හා ඉන්දියාවට පැමිණීම එවැනි එකතුවක් සඳහා වූ ආරම්භයක් කරගත හැකි ද? ඉන්දියාවට දකුණු ආසියානු කලාපීය බලවතා වීමේ අභිලාෂයක් ඇත. එහෙත් දේශපාලන අභියෝගය වනුයේ ඒ අභිලාෂය පරාජය කරමින් බටහිර යටත්විජිතවාදයට එරෙහිව ක්‍රියාකිරීම ය. අද ඇමරිකාවේ මතයට විරුද්ධව යමින් ඉරාන ඉන්දීය තෙල් නළ ඉදිකිරීමට ඉන්දියාව හා ඉරානය එකඟ වී ඇත. නැගනහිර පළාත්සභා මැතිවරණය හුදු පළාත්සභා මැතිවරණයක් පමණක් නො වෙයි. ලෝක දේශපාලනය මෙන් ම දකුණු ආසියානු කලාපීය දේශපාලනය ද එහි දී වැදගත් වෙයි. රනිල් හකීම් බුෂ් හවුල නැගෙනහිර ජයගුහණයකිරීමට ඉඩක් ඇතැයි නො සිතමු. යම් අයුරකින් නැගෙනහිර ජනතාව ඔවුන් බලයට පත්කළහොත් ඒ නැගෙනහිර පළාත මුදාගත් රණවිරුවන් පාවාදීමක් වනු ඇත. බුෂ්ගේ ආශිර්වාදයෙන් කොටි නැවතත් නැගෙනහිරට එනු ඇත්තේ රනිල්ගේ ඊනියා නිරායුධ කිරීමේ පණත් ඔස්සේ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva